රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2025.03.03

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ
අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු
වෙබ් අඩවි කර්තෘ

**රාත්‍රී කාලයේ ධාවනය වන දුම්රියන්හි වන අලීන් ගැටීම වැලැක්වීම සඳහා අමතර වේග සීමා ක්‍රියාත්මක කිරීම සහ දුම්රිය ආරම්භක වේලාවන් සංශෝධනය කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් දුම්රිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ගමනාගමන) එන්.ජේ.ඉදිපොලගේ මහතා විසින් මා වෙත එවන ලද නිවේදනය සුදුසු පරිදි ප්‍රචාරය කිරීම සඳහා ඔබ වෙත එවමි.

එච්.එස්.කේ.ජේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

දුරකථන අංකය :- 0112 513638
ෆැක්ස් :- 0112 514753
විද්‍යුත් ලිපිනය :- dgi@dgi.gov.lk

දුම්රිය
புகையிரத
Railway } GMF 35

ඔබේ අංකය
உமது இல.
Your No. } ..............................

දුරකතන (දු.ක.)
தொலைபேசி (பொ.மு.)
Telephone (G. M. R.) } 2431177

E-mail : gmrsir@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office } 2421281

ෆැක්ස්
தொலைநகல்
Fax } 2446490

# ශ්‍රී ලංකා දුම්රිය සේවය
## இலங்கை புகையிரத சேவை
## SRI LANKA RAILWAYS

මගේ අංකය
எனது இல.
My No. } ඉ.ඒ./විවිධ/2025

සාමාන්‍යාධිකාරී කාර්යාලය,
තැ. පෙ. 355, ඕල්කොට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர் அலுவலகம்,
த. பெ. 355, ஒல்கொட் மாவத்தை,
கொழும்பு 10.

General Manager's Office,
P. O. Box 355, Olcott Mawatha,
Colombo 10.

2025.03.03

අධ්‍යක්ෂ ජෙනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

**<u>රාත්‍රී කාලයේ ධාවනය වන දුම්රියන්හි වන අලින් ගැටීම වැලැක්වීම සඳහා අමතර වේග සීමා ක්‍රියාත්මක කිරීම සහ දුම්රිය ආරම්භක වේලාවන් සංශෝධනය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙනි.

රාත්‍රී කාලයේ ධාවනය වන දුම්රියන්හි වන අලින් ගැටීම වැලැක්වීම සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව මේ වනවිට දීර්ඝ කාලීන මෙන්ම කෙටි කාලීන ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇති අතර එහි මූලික පියවරක් ලෙස වන අලින් බහුල ලෙස සැරිසැරීම පිලිබඳව වාර්තා වී ඇති ප්‍රදේශයන්හිදී දුම්රිය ධාවන වේගය අවම වන ලෙස එම කලාප සඳහා අඩු වෙගසීමාවක් ලබාදී දුම්රිය කාලසටහන් සංශෝධනය කිරීමට සහ අදාළ ප්‍රදේශයන්හි වන අලින් සැරිසරන කාලසීමාවන්හි දුම්රිය ධාවනය අවම වන ලෙස එම ප්‍රදේශයන් හරහා දුම්රිය ගමන් කිරීමේදී වන අලින් වැඩිවශයෙන් සැරිසරන කාලසීමාවන්ට පෙර සහ එම කාලසීමාවන්ට පසුව දුම්රිය ධාවනය කිරීම සඳහා දුම්රිය ආරම්භක වෙලාව සංශෝධනය කිරීමට මේ වන විට දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

ඒ අනුව මඩකලපුව මාර්ගයේ පලුගස්වැව සිට හිඟුරක්ගොඩ දක්වා සහ වැලිකන්ද සිට පූනානි දක්වා ද ත්‍රිකුණාමලය මාර්ගයේ ගල්ඔය හන්දිය සිට කන්තලේ දක්වා ප්‍රදේශය ආවරණය වන පරිදි මෙම දුම්රිය කාලසටහන් සංශෝධනය සිදුකර ඇති අතර එය 2025 මාර්තු 07 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇත. තව ද මීට සමගාමීව එදින සිට කොළඹ කොටුව සහ මඩකලපුව අතර ධාවනය වන "මීනගයා" නගරාන්තර රාත්‍රී තැපැල් දුම්රිය සඳහා s-13 වර්ගයේ බලවේග කට්ටලයක් ධාවනයට යෙදවීම සඳහා ද සැලසුම් කර ඇත.

2025.03.07 දින සිට ඉදිරි දිනයන් සඳහා කලින් ආසන වෙන්කිරීම් සිදුකරන ලද මගීන් හට නියමිත පරිදි කල්වේලා ඇතිව අදාළ දුම්රියන් සඳහා පැමිණීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙන අතර මෙලෙස දුම්රිය ආරම්භක වේලාවන් සංශෝධනය කිරීම සහ ඉහත පරිදි වෙගසීමා පැනවීම හේතුවෙන් ගමනාන්ත දුම්රිය ස්ථාන වෙත ලඟාවීමේදී අමතර කාලයක් ගත කිරීමට සිදුවීම සම්බන්ධයෙන් මගී ජනතාව වෙත දුම්රිය දෙපාර්තමේන්තුවේ කණගාටුව පළකර සිටින අතර වන අලින් සුරැකීම ජාතික වගකීමක් ලෙස සලකා දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කරන බව තවදුරටත් ප්‍රකාශ කර සිටිමි.

2025.03.07 දින සිට සංශෝදිත දුම්රිය ආරම්භක සහ ගමනාන්ත වේලාවන් මේ සමග ඉදිරිපත් කර ඇති අතර මේ සම්බන්ධයෙන් ජනතාව වෙත පුළුල් ප්‍රචාරයක් ලබාදීමට කටයුතු කරන්නේ නම් මැනවි.

ඇමිණුම 01 යි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)

එන්. ජේ. ඉදිපොලගේ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන) කාර්යාලය
දුම්රිය මූලස්ථානය
කොළඹ 10

## 2025.03.07 දින සිට සංශෝධිත දුම්රිය ගමනාරම්භ සහ ගමනාන්ත වේලාවන්.

| දුම්රිය අංකය | පිටත්වීම | | ලගාවීම | |
|---|---|---|---|---|
| 6011 (කොළඹ කොටුව-මඩකලපුව) "උදයදේවි" | කොළඹ කොටුව | පිටත්වීම පෙ.ව.06:05 | මඩකලපුව | ලගාවීම ප.ව. 14:49 |
| 6075 (කොළඹ කොටුව-මඩකලපුව) "පුලතිසි" | කොළඹ කොටුව | පිටත්වීම ප.ව. 15:15 | මඩකලපුව | ලගාවීම රාත්‍රී 12:03 |
| 6079 (කොළඹ කොටුව-මඩකලපුව) "මීනගයා" | කොළඹ කොටුව | පිටත්වීම රාත්‍රී 23:00 | මඩකලපුව | ලගාවීම පෙ.ව.08:28 |
| | | | | |
| 6012 (මඩකලපුව-කොළඹ කොටුව) "උදයදේවි" | මඩකලපුව | පිටත්වීම පෙ.ව. 06:10 | කොළඹ කොටුව | ලගාවීම ප.ව. 14:53 |
| 6076 (මඩකලපුව-කොළඹ කොටුව) "පුලතිසි" | මඩකලපුව | පිටත්වීම අළුයම 01:30 | කොළඹ කොටුව | ලගාවීම පෙ.ව.10:10 |
| 6080 (මඩකලපුව-කොළඹ කොටුව) "මීනගයා" | මඩකලපුව | පිටත්වීම ප.ව. 18:15 | කොළඹ කොටුව | ලගාවීම අළුයම 03:30 |
| | | | | |
| 7083 (කොළඹ කොටුව-ත්‍රිකුණාමලය) | කොළඹ කොටුව | පිටත්වීම රාත්‍රී 21:30 | ත්‍රිකුණාමලය | ලගාවීම පෙ.ව.06:08 |
| 7084 (ත්‍රිකුණාමලය-කොළඹ කොටුව) | ත්‍රිකුණාමලය | පිටත්වීම ප.ව. 18:30 | කොළඹ කොටුව | ලගාවීම අළුයම 03:19 |

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)

එස්. ජේ. ඉඳිපොලගේ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන කාර්...
දුම්රිය මූලස්ථානය
කොළඹ 10